# ක්‍රිප්ටෝ මුදල් (Cryptocurrency) ආයෝජන වංචාවලින් මහජනතාව සුරැකීම

**ක්‍රිප්ටෝ මුදල් ආයෝජනය හා සම්බන්ධ බව හඟවන වංචනික ක්‍රියාකාරකම්වල දැඩි ලෙස ඉහළ යෑමක් මේ දිනවල දක්නට ලැබේ. වෙහෙස මහන්සියෙන් උපයාගත් මුදල් රැක ගැනීමට, සුපරීක්ෂාකාරීව සිටීම සහ වංචාකරුවන් විසින් යොදා ගන්නා උපායන් පිළිබඳ දැනුවත් වීම ඉතා වැදගත් වේ.**

## වංචාකරුවන් ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?

වංචාකරුවෝ මේ සඳහා විවිධ උපක්‍රම භාවිත කරති. ඒ අතරින් ඉහළ ප්‍රතිලාභ සහිත යෝජනා ක්‍රම ප්‍රචාරණය කිරීමට සමාජ මාධ්‍ය අනිසි ලෙස භාවිත කිරීම සහ බොහෝ විට ඔවුන් ලැබූ ඉපැයුම් පිළිබඳ අතිශයෝක්තියෙන් සමාජ මාධ්‍යයන්හි පළකිරීම මින් ප්‍රධාන වේ. මෙමගින් එම යෝජනා ක්‍රමයන් නීත්‍යනුකූල බව හඟවා, නව සහභාගීකරුවන් එම යෝජනා ක්‍රම කරා ආකර්ෂණය කරගනු ලබයි. තවද, වංචාකරුවෝ වංචාවට හසුවන තැනැත්තන් සම්බන්ධ කර ගැනීම සඳහා වට්ස්ඇප් (WhatsApp) සහ ටෙලිග්‍රෑම් (Telegram) වැනි සමාජ මාධ්‍ය බහුල ව භාවිත කරති.

සමාජ මාධ්‍ය තුළ පළකරන මෙවැනි වංචනික ප්‍රචාරණ දැන්වීම් බොහෝ විට වෘත්තීමය බවක් පෙන්නුම් කරන වෙබ්අඩවි වෙත ඔබව යොමු කරන අතර එමගින් ඒවායෙහි වංචනික ස්වභාවය සැඟවීම අරමුණු කරයි. තවත් ඉදිරි පියවරක් ලෙස, ඉහළ ප්‍රතිලාභ ඉපැයීම හෝ ක්‍රිප්ටෝ මුදල් වෙළෙඳාම් කිරීම පිළිබඳ නොමග යවන ආකාරයේ තොරතුරු සපයමින්, මෙම ව්‍යාජ යෝජනා ක්‍රම පිළිබඳව පන්ති හෝ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීමට ද ඇතැම් වංචනිකයෝ කටයුතු කරති.

ආයෝජනයක් සිදු කළ පසු, වංචාකරුවන් කඩිනමින් එම මුදල් ඔවුන් සතු කර ගැනීම හෝ, තවත් පුද්ගලයන් මෙම වංචාවට හසු කර ගැනීම සඳහා පුද්ගලයින් මුලා කිරීම අඛණ්ඩ ව සිදු කරයි. ඔබේ ආයෝජනය ඉවත් කර ගැනීමට උත්සාහ කරන තෙක් ඔබ වංචාවකට හසු වී ඇතැයි ඔබට නොවැටහීම මෙහි හඳුනා ගත හැකි වැදගත් ම ලක්ෂණයකි.

## වංචාවලින් ඔබ රැක ගැනීම

ක්‍රිප්ටෝ මුදල් ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ නියාමනය නොවන අතර, එය නෛතික මුදලක් ලෙස ද නොසැලකෙයි. තව ද, ඒවායේ භාවිතය සම්බන්ධයෙන් මෙරට තුළ නිසි නියාමන ආරක්ෂණයක් ද නොමැත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රිප්ටෝ මුදල් භාවිතය හා එහි ආයෝජනය කිරීමේ ඇති අවදානම සහ පාරිභෝගික ආරක්ෂණ ගැටලු සම්බන්ධ ව මාධ්‍ය නිවේදන ඔස්සේ අවධාරණය කර ඇත.

ක්‍රිප්ටෝ මුදල් ආයෝජනවලට ඉහළ ප්‍රතිලාභ ලබා දෙන බවට පොරොන්දු වන මූල්‍ය වංචා වැඩි වශයෙන් ඉහළ යන බවත් එවැනි යෝජනා ක්‍රම සාම්ප්‍රදායික නියාමන ආරක්ෂණ මඟහරිමින් ක්‍රියාත්මක වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාවට තමන් වෙහෙසී උපයා ගත් මුදල් අහිමි වීම සිදුවිය හැකි බවත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවධාරණය කර ඇත.

## අනතුරු ඇඟවීමේ සලකුණු හඳුනා ගැනීම.

ඔබට අනපේක්ෂිත අවස්ථාවක ලැබෙන පණිවුඩ, ආයෝජනය කිරීමට ඔබව යුහුසුළු කරවන හෝ අසාමාන්‍ය ඉහළ ප්‍රතිලාභ ලබා දෙන බවට පොරොන්දු වන පණිවුඩ සම්බන්ධව ප්‍රවේශම් වන්න. යම් ආයෝජනයක් සැබෑවක් යැයි විශ්වාස කිරීමට අපහසු තරම් වාසිදායක වේ නම්, එය බොහෝ විට වංචාවක් විය හැකි බව සැමවිටම තරයේ මතකයේ තබා ගන්න.

## වංචාවන්ට ප්‍රතිචාර දැක්වීම

වංචාවක් යැයි සැක කරන්නේ නම්, ඒ පිළිබඳව ළඟ ම ඇති පොලිස් ස්ථානය වෙත දැනුම් දෙන්න. ඔබ වංචාවකට හසු වී ඇත්නම්, පසුවිපරම් උත්සාහයන් පිළිබඳ විමසිලිමත් වන්න. ඒ අනුව, වංචාකරුවන් යම් ගාස්තුවකට අලාභ ප්‍රතිපූරණය කිරීම සඳහා විවිධ යෝජනා ක්‍රම හෝ දීමනා සමඟ යළි පෙනී සිටිය හැකියි.

## ශ්‍රී ලංකා මහ බැංකු උපදේශනය: ඔබේ මුදල් රැක ගන්න

අන්තර්ජාලය, වෙනත් මාධ්‍ය හෝ සෘජුව පුද්ගලයන් විසින් ඉදිරිපත් කරනු ලබන විවිධ ආකාරයේ ක්‍රිප්ටෝ මුදල් යෝජනා ක්‍රම වල ආයෝජනය නොකිරීම තුලින් උපයාගත් ධනය ආරක්ෂා කරගන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවට උපදෙස් දෙනු ලබයි. තවද, ක්‍රිප්ටෝ මුදල් සම්බන්ධ මූලික කාසි නිකුතු (Initial Coin Offerings), ක්‍රිප්ටෝ මුදල් ජනනය කිරීමේ කාර්යයකට (Cryptocurrency Mining Operations), ක්‍රිප්ටෝ මුදල් හුවමාරුවකට (Cryptocurrency Exchange), ක්‍රිප්ටෝ මුදල් සම්බන්ධ තැන්පතු භාර ගැනීම හෝ භාරකාර සේවා සැපයීමට හෝ ක්‍රිප්ටෝ මුදල් ආයෝජන උපදේශන සේවා වැනි කටයුතු සඳහා කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට කිසිදු බලපත්‍රයක් හෝ අවසරයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී නොමැති බව මාධ්‍ය නිවේදන මගින් අවධාරණය කර ඇත.

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා මහා බැංකුව විසින් ආයතන කිහිපයක් බැංකු පනතේ 83(ඇ) වගන්තිය උල්ලංඝනය කරමින් තහනම් යෝජනා ක්‍රම පවත්වාගෙන යන ලෙස/පැවැත්වූ ලෙස තීරණය කරන ලදී. ඒ අතරින්, පහත ආයතන ක්‍රිප්ටෝ මුදල් යෙදවීම ප්‍රවර්ධනය කර ඇති බව නිරීක්ෂණය වී ඇත.

1. Sport Chain App, Sports Chain ZS Society Sri Lanka
2. OnmaxDT
3. MTFE App, MTFE SL Group, MTFE Success Lanka (Pvt) Ltd and MTFE DSCC Group (Pvt) Ltd.

## මූල්‍ය බුද්ධි ඒකකයේ පණිවුඩය

පරීක්ෂාකාරී වන්න, දැනුවත් වන්න, ඔබේ මූල්‍ය යහපැවැත්ම ආරක්ෂා කරගන්න. යම් සැකකටයුතු ක්‍රියාවක් ඇත්නම්, කඩිනමින් එය බලධාරීන් වෙත දැනුම් දෙන්න. ඔබේ සුපරීක්ෂාකාරී බව ක්‍රිප්ටෝ මුදල් ආයෝජන වංචා මැඩපැවැත්මෙහිලා මහඟු උපකාරයක් වනු ඇත.


**අධ්‍යක්ෂ**
**මූල්‍ය බුද්ධි ඒකකය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**අංක 30, ජනාධිපති මාවත**
**කොළඹ 01**

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

**මූල්‍ය බුද්ධි ඒකකය**
**நிதியியல் உளவறிதல் பிரிவு**
**FINANCIAL INTELLIGENCE UNIT**

0112477125 | 0112477692 | fiu@cbsl.lk | www.fiusrilanka.gov.lk